"ගුරා" ද? "ගුරුවරයා" ද?

පුවත් වාර්තාකරණයේදී කිසිදු පාර්ශවයක් නොගනිමින්, සමබර භාවය ආරක්ෂා කර ගනිමින් කරුණු සහ තොරතුරු පමණක් ඉදිරිපත් කිරීමේ වැදගත්කම අපි ඉස්මතු කොට ඇත්තෙමු.

මෙය යම් වරදකට හසුවන සැකකරුවන් හෝ වරදකරුවන්ව හැඳින්වීමට විවිධ සෘණාත්මක යෙදුම් භාවිතය සම්බන්ධයෙන්ද එලෙසින්ම වලංගු වේ.

නිදසුනක් ලෙසට බාලවයස් සිසුවියන්ට ලිංගික අතවර කළ බවට පැවසෙන සිදුවීමක් සම්බන්ධයෙන් ඔවුන්ගේ පාසලේ ගුරුවරයෙකු අත්අඩංගුවට ගැනීමට සෙවීම පිළිබඳ පුවතක් අරුණ සහ දිනමිණ පුවත් සිරස්තල තුළ (සැප්තැම්බර් 14, 2023) සඳහන්ව තිබූ ආකාරය විමසා බැලිය හැක.

දිනමිණ - "සිසුවියන් 11කට ලිංගික අතවර කළ ඉංග්‍රීසි ගුරා අල්ලන්න සොයයි"

අරුණ - "ඉංග්‍රීසි ගුරුවරයෙක් පහේ සිසුවියන් 11දෙනෙකුට අතවර කරලා"

ඔබ සිතන ලෙසට,

1) ගුරු වෘත්තියේ නියැළෙන්නෙකු සැකකරුවෙකු හෝ වරදකරුවෙකු වන අවස්ථාවන්හිදී "ගුරා" වැනි නිෂේධනාත්මක යෙදුම් භාවිතා කරමින් ඔවුන්ව හැඳින්වීම ඔස්සේ, එම සමස්ත වෘත්තිය සම්බන්ධයෙන්ම සෘණාත්මක ආකල්පයන් සමාජය තුළ වර්ධනය වීමක් සිදුවිය නොහැකි ද?

2) ඒ අනුව, සිදුවීමේ කිසිදු පාර්ශවයක් නොගනිමින්, කරුණු පමණක් වාර්තා කර ඇති, වඩාත් ආචාර ධාර්මික වාර්තාකරණය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?

